# ධම්මපදය

## පුප්ඵ වර්ගය (01-02 ගාථා)

### 1. ගාථාව

**"කෝ ඉමං පඨවිං විජෙස්සති - යමලෝකං ච ඉමං සදේවකං,**
**කෝ ධම්මපදං සුදේසිතං - කුසලෝ පුප්ඵමිව පචෙස්සති."**

**පදාර්ථය**

| | | |
|---|---|---|
| **කෝ** | - | කවරෙක් |
| **ඉමං පඨවිං (ච)** | - | මේ පොළොව (ද) |
| **යමලෝකං ච** | - | යමලෝකය ද |
| **ඉමං සදේවකං (ච)** | - | දෙව්ලොව සහිත වූ මේ මිනිස්ලොව (ද) |
| **විජෙස්සති** | - | දිනන්නේ ද? |
| **කෝ** | - | කවරෙක් |
| **ධම්මපදං සුදේසිතං** | - | මොනවට දෙසූ ධර්ම කොට්ඨාශය |
| **කුසලෝ පුප්ඵමිව** | - | දක්ෂ මාලාකාරයෙකු (හොඳ) මල් රැස් කරන්නාක් සේ |
| **පචෙස්සති** | - | ප්‍රත්‍යක්ෂ කරන්නේ ද? |

**භාවාර්ථය**

කවරෙක් (ආත්මභාව සංඛ්‍යාත) මේ පොළොව දන්නේ ද? සිවු අපාය ද දෙව්ලොව සහිත මේ මනුලොව ද දන්නේ ද දක්ෂයා මල් තෝරා රැස් කරන්නාක් මෙන් කවරෙක් නම් මනා ව දෙසූ (සත්තිස් බෝධිපාක්ෂික) ධර්මය දන්නේ ද?

### 2. ගාථාව

**"සේඛෝ පඨවිං විජෙස්සති - යමලෝකං ච ඉමං සදේවකං,**
**සේඛෝ ධම්මපදං සුදේසිතං - කුසලෝ පුප්ඵමිව පචෙස්සති"ති.**

**පදාර්ථය**

| | | |
|---|---|---|
| **සේඛෝ** | - | ශෛක්ෂ තෙමේ |
| **පඨවිං** | - | (ආත්මභාව සංඛ්‍යාත) පොළොව |
| **විජෙස්සති** | - | දිනන්නේ ය. |
| **යමලෝකං ච** | - | යමලෝකය ද (සතර අපාය ද) |
| **ඉමං සදේවකං (ච)** | - | දෙව්ලොව සහිත වූ මේ මනුෂ්‍යලෝකය (ද) |
| **සේඛෝ** | - | ශෛක්ෂ තෙමේ |
| **සුදේසිතං** | - | මනා ව දෙසන ලද්ද වූ |
| **ධම්මපදං** | - | (සත්තිස් බෝධිපාක්ෂික) ධර්මය |
| **කුසලෝ පුප්ඵමිව** | - | දක්ෂ මල්කරුවෙකු (හොඳ) මල් කඩා රැස් කරන්නාක් මෙන් |
| **පචෙස්සති** | - | අවබෝධ කරන්නේ ය. |

**භාවාර්ථය**

ශෛක්ෂයා ආත්මභාව සංඛ්‍යාත පොළොවත් සතර අපායත් දෙව්ලොව සහිත මේ මනුලොවත් දන්නේ ය. දක්ෂ මල්කරුවා මල් තෝරා රැස් කරන්නාක් මෙන් ශෛක්ෂයා මනාව දෙසූ සත්තිස් බෝධිපාක්ෂික ධර්මය අවබෝධ කරන්නේ ය.

**නිදාන කථාව**

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙම ගාථා දේශනා කළේ සැවැත් නුවර වැසි භික්ෂූන් වහන්සේලා පන්සියයක් අරභයා ය.

බුදුරජාණන් වහන්සේ සමග ජනපද චාරිකාවේ යෙදුණු පන්සියයක් භික්ෂූන් වහන්සේලා සැවැත් නුවර දෙවුරම් වෙහෙරට වැඩමකොට සවස් කාලයෙහි උපස්ථාන ශාලාවෙහි රැස් වූ අවස්ථාවෙක තමන් වැඩි ප්‍රදේශවල පොළොව සම විසම වීම පිළිබඳ ව කථා කරමින් පසු වූහ.

මේ කථාව අතරෙහි ශාලාවට වැඩම කළා වූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් කථා කරමින් සිටි කරුණ අසා දැන ගෙන "මහණෙනි, මේ පොළොව වී ඉසීම් ආදි දෙයට ප්‍රයෝජන වුවත් විදර්ශනා නමැති සී සා මාර්ග නමැති බීජ වපුරා ඵල සමවත නමැති බත සකස් කර ගැනීමට ආධාර නො වේ. ඒ නිසා ඔබ විසින් සිත්සතන් නමැති පොළොව පිළිබඳ ව ප්‍රයෝජනවත් දෙයක් කිය යුතු යැ"යි වදාළ සේක.

"කවර කෙනෙක් මේ ආත්මභාවය නමැති පොළොව තම නුවණින් දැක ගන්නේ ද? දෙව්ලොව මිනිස්ලොව සහ සතර අපාය කවරෙක් දැන ගන්නේ ද? දක්ෂ මල්කරුවෙකු මල් දම් ගෙතීමට සුදුසු මල් තෝරා නෙළා ගන්නා සේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මය කවර කෙනෙක් විසින් දැන ගන්නේ ද? ඒ තෙමේ රහත් මගින් ඇලීම හරින්නේ නිවැරදි අවබෝධයෙනි. ආයුෂ්මතුන් අපාය-භූමිය සහ අසඤ්ඤ-භූමියෙහිත් සෙසු භූමිවලත් උපදින්නේ නැති නිසා දෙව්ලොව මිනිස්ලොව සතර අපාය යථා පරිදි දැන ගෙන රහත් මගින් ඒ සියල්ලක් ම අත්හරින හෙයින් (රහතුන්) දැනගත්තෝ වෙති.

ගෙතීමට මල් නෙළන මල්කරුවා මල් නෙළීමට ගොස් නොයෙක් ලෙසින් නුසුදුසු මල් නො ගෙන මල්මාලා ගෙතීමට සුදුසු මල් පමණක් නෙළා ගනී. ඒ අයුරින් ත්‍රිවිධ ශික්ෂාවෙන් හික්මුණ පුද්ගලයෝ සත්දෙනා සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් නොයෙක් ලෙසින් පරීක්ෂා කර තම නුවණින් දැන ගනිති.

පෘථිවිය පිළිබඳ ව කථාවෙහි යෙදී සිටි පන්සියයක් භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන් වහන්සේ "කෝ ඉමං පඨවිං විජෙස්සති"ති යන මෙම ධර්මදේශනාවෙන් ප්‍රශ්නය විසඳ ධර්මදේශනා කළ සේක.

මේ ධර්මදේශනාව අවසානයේ පන්සියයක් භික්ෂූන් වහන්සේලා සිවුපිළිසිඹියාවන් ලබා රහත් බවට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය. මේ ගාථා දෙකෙන් ඉදිරිපත් කෙරෙන ආත්මභාවය ගැන මැනවින් දැන ගැනීම නම්, ඒවා නාම - රූප - ස්කන්ධ - ධාතු - ආයතන වශයෙන් දුක්ඛසත්‍යය පරිච්ඡේදතා ඤාණයෙන් හෙවත් පඤ්චස්කන්ධය බෙදා බලන නුවණින් ද විදර්ශනාඥානයෙන් හෙවත් සංස්කාරයන් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් දන්නා නුවණින් ද පිළිවිද ගැනීමයි. එසේ දැන ගත් විට තමා පිළිබඳ වත් බැහැර දේ පිළිබඳ ව ත් ඇති වන තෘෂ්ණාව ඉවත් වේ.

තව ද චතුසතිපට්ඨාන, චතුසම්මප්පධාන, චතුඉද්ධිපාද, පඤ්ච-ඉන්‍ද්‍රිය, පඤ්චබල, සප්තබොජ්ඣඞ්ග, ආර්යඅෂ්ටාංගික මාර්ගය ය යි ප්‍රභේද වශයෙන් සත්තිසක් වන මෙම බෝධිපාක්ෂික ධර්ම චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීමේ දී යෝගාවචරයාට උපකාර වන බැවින් බෝධිපාක්ෂික ධර්ම නමින් හඳුන්වනු ලැබේ.

එහෙයින් ඔබ ද නිෂ්ප්‍රයෝජන කථා අත්හැර දෙලොවට ප්‍රයෝජනවත් යහපත් වූ දේ පිළිබඳ ව කතා කරමින් දෙලොව අභිවෘද්ධිය සලසා ගන්නේ මැනවි.

**සාධු ! සාධු !! සාධු !!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(දුරුතු 2551)**

<u>**සම්පාදක:**</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>**ධර්මදානය:**</u> පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පරිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**